WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**12 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2019**

ශෛවනෙරි I, II
சைவநெறி I, II
Saivaneri I, II

2019.12.02 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ශෛවනෙරි I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** "වානෝර්රුම් ආනෛ මුගත්තානෛක් කාදලාට් කුප්පුවර්..." යන්නෙහි ප්‍රශංසා කෙරෙනු ලබන දෙවියන්,
(1) ශිවපෙරුමාන් ය. (2) විනායගර් ය. (3) ඉන්ද්‍රන් ය. (4) මන්මදන් ය.

**2.** 'ඉරුක්කු' යන වචනයේ අර්ථය වන්නේ,
(1) ගීතිකාව ය. (2) දැනුම ය. (3) සංගීතය ය. (4) මායම් ය.

**3.** මුරුග දෙවියන්ව ප්‍රශංසා කරන කන්දරලංගාරම් ග්‍රන්ථයේ කතෘ,
(1) තායුමානවර් ය. (2) කුමරගුරුබරර් ය. (3) අරුණගිරිනාදර් ය. (4) අභිරාමිප්පට්ටර් ය.

**4.** ලිංග වන්දනාව හරහා මෝක්ෂය ලබා ගත්තා ලද්දේ,
(1) සේරමාන් පෙරුමාල් ය. (2) අප්පූතියඩිහල් ය.
(3) සිරුත්තොණ්ඩර් ය. (4) ඉලෛයාන්කුඩිමාර නායනාර් ය.

**5.** දේවාලයේ සාමාන්‍යයෙන් ස්ථාපනය කරනු ලබන බහිරව මූර්තිය වන්නේ,
(1) කාල බහිරව ය. (2) ඥාන බහිරව ය. (3) මහා බහිරව ය. (4) නරසිම්ම බහිරව ය.

WWW.OLEVELAPI.COM

**6.** අවමංගල්‍ය උත්සවය (අබරක්කිරියෙ)ක් හා සම්බන්ධ චාරිත්‍රයක් **නොවන්නේ,**
(1) ඒගෝදිට්ටම් ය. (2) සබින්ඩීකරණම් ය. (3) කන්නිගාදානම් ය. (4) මාසිකම් ය.

**7.** 'උපවාසම්' යන වචනයෙන් අදහස් වන්නේ,
(1) දෙවියන් ඉහළ සිට පහළ බලා ඒම ය. (2) ආහාර අඩුකර ගැනීම හෝ නොකා සිටීම ය.
(3) ක්‍රමානුකූලව උපවාසය (විරදම්) පිළිපැදීම ය. (4) දෙවියන් හා සමීපව ජීවත් වීම ය.

**8.** "කිරි සමග කලවම් කරන ලද බත් අනුභව කර බඩගින්න යන දුක නිවාගන්න." යනුවෙන් දෙවියන්ගේ කීම අසන්නට ලැබුණු නායනාර්තුමා කවරෙක් ද?
(1) ඉයට්පගෛ නායනාර් (2) තිරුඥානසම්බන්ත නායනාර්
(3) කුංගිලියක්කලය නායනාර් (4) තිලගවතියාර්

**9.** "මගිලවරු මණම්පුණර්න්ද මාදිනියාර් මණිවයිට්‍රිල්..." යන ගීතිකාව මගින් සේක්කිලාර් විසින් ප්‍රශංසා කරනු ලැබෙන්නේ,
(1) තිලගවදියාර්ව ය. (2) මංගයර්ක්කරසියාර්ව ය.
(3) පුනිදවදියාර්ව ය. (4) ඉසෛඥානියාර්ව ය.

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**10.** ශිවඥානපෝදම් කෘතිය මුල්කරගෙන රචනා කළ ග්‍රන්ථය වන්නේ,
(1) ශිවප්‍රකාශම් ය. (2) තිරුවරුට්පයන් ය.
(3) ශිවඥානසිත්තියාර් ය. (4) නෙංජුවිඩුතුදු ය.

**11.** "යාවර්ක්කුමාම් උන්නුම් පෝදොරු කෛප්පිඩි" යනුවෙන් බත් දන්සලේ විශේෂත්වය අවධාරණය කළේ,
(1) තිරුනාවුක්කරසර් ය. (2) තිරුමූලර් ය.
(3) තායුමානවර් ය. (4) ඖවෛයාර් ය.

**12.** කෝට්ටේ රජ සමයට අයත් ශිව දේවාලයක් ලෙස සැලකෙන රත්මලාන ප්‍රදේශයේ පිහිටා ඇති ශිව දේවාලයේ නම කුමක් ද?
(1) අලගේෂ්වරම් (2) පොන්නම්බලවානේෂ්වරම්
(3) චන්ද්‍රසේකරේෂ්වරම් (4) තිරුනන්දීෂ්වරම්

**13.** සම්පත් බොහෝමයකින් පිරිපුන් වූ හෙට්ටි කෙනෙකුගේ බිරිඳ වන අමරාවති විසින් පිළිපදින ලද, චිත්‍රපුත්‍රනාර් උපවාස දිනය වන්නේ,
(1) ආඩිච්චෙව්වායි ය. (2) සිත්තිරා පෞර්ණමි ය.
(3) මාසිමගම් ය. (4) ආනි උත්තරම් ය.

**14.** "ආදරය නොමැති ජීවිතය ඇට කටු හම්වලින් ආවරණය කරන ලද ශරීරයක් වැනිය." යනුවෙන් සඳහන් කරන ලද්දේ,
(1) තිරුමූලර් විසිනි. (2) තායුමානවර් විසිනි.
(3) තිරුවල්ලුවර් විසිනි. (4) කුමරගුරුබරර් විසිනි.

**15.** ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ශෛවප්‍රකාශ විද්‍යාශාලා ඇරඹූ විද්වතා වන්නේ,
(1) එස්. සිවපාද සුන්දරනාර් ය. (2) ඉන්දු බෝඩ් එස්. රාසරත්තිනම් ය.
(3) ශ්‍රීලශ්‍රී ආරුමුගනාවලර් ය. (4) සර්. පොන්. රාමනාදන් ය.

**16.** ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශයේ මුරුග දෙවියන්ගේ වේල් ස්ථාපනය කරන ලද දේවාල හඳුන්වනු ලබන්නේ,
(1) තේසත්තු කෝවිල් යනුවෙනි. (2) වේල්විඩු තලංගල් (කෝවිල්) යනුවෙනි.
(3) පාසරෛ තලංගල් යනුවෙනි. (4) තිරුප්පඩෛ කෝවිල් යනුවෙනි.

**17.** ශෛව සිද්ධාන්ත බැල්මෙහි තුන්වාර්ගික ආත්මවල කොටසක් වන සකලර්ට ආශිර්වාද කිරීම සඳහා ශිව දෙවියන්,
(1) මානුෂ හැඩයෙන් වැඩ සිටියි.
(2) පාර්වති දේවිය සමඟ පරමේශ්වරර් ලෙස වැඩ සිටියි.
(3) ආලෝකයක් ලෙස වැඩ සිටියි.
(4) ලිංගයක හැඩයෙන් වැඩ සිටියි.

**18.** "දෙවියන් යනු එක් අයෙකි." යන්න මැනවින් විදහා දක්වන ගීතිකා ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) "කුනිත්ත පුරුවමුං...." සහ "වානාහි මන්නාහි..."
(2) "එල්ලා උලගමුම් ආනායි නීයේ...." සහ "තුක්කුම් පතුවල් තුරෛ..."
(3) "ඊරායි මුදල් ඔන්ඩ්‍රායි...." සහ "තිල්ලෛවාල් අන්දනර් තම්...."
(4) "අප්පන්නී අම්මෛනී...." සහ "ඒහන් අනේහන්...."

WWW.OLEVELAPI.COM

**19.** "සුඛෝපභෝගී ජීවිතය ආධ්‍යාත්මක සංවර්ධනයට සුදුසු නැත." යන අදහස ශිෂ්‍යයන්ට ඉදිරිපත් කළේ,
(1) උමාපති සිවාචාරියාර් ය. (2) මරෛඥාන සම්බන්තර් ය.
(3) මෙයිකණ්ඩදේවර් ය. (4) අරුණන්ති සිවාචාරියාර් ය.

**20.** සෙනසුරු වන්දනාව හා සම්බන්ධ කරුණු ඇතුළත් වරණය කුමක් ද?
(1) තලබත් සහ රතු වර්ණ සළුවකි (පට්ටු) (2) තල සහ කහ වර්ණ සළුවකි
(3) තලබත් සහ සුදු වර්ණ සළුවකි (4) තල සහ කළු වර්ණ සළුවකි

**21.** ශෛව ආගමේ ප්‍රධාන මාර්ගයක් ලෙස සලකනු ලබන්නේ,
(1) සියලුම ජීවීන් දෙවියන්ගේ විවිධ ස්වරූප ලෙස සැලකීමයි.
(2) අන්‍ය ආගම් හෙළා දැකීමයි.
(3) කුල සාරධර්ම වෙනස්කම් දිරිගැන්වීමයි.
(4) පැවිදි තත්ත්වය අවධාරණය කර දැක්වීමයි.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

22. දේවාලය තුළ කළ යුතු ක්‍රියාවක් වන්නේ,
   (1) ස්ත්‍රීන් අෂ්ටාංග නමස්කාරයේ යෙදීමයි.
   (2) තිර රෙද්ද වසා තිබෙන අවස්ථාවේ දෙවියන් වන්දනාවේ යෙදීමයි.
   (3) දේවාලයේ කටු ගෑම සහ ගොම ගෑම යන ක්‍රියාවල යෙදීමයි.
   (4) ප්‍රධාන කුටියේ සිටින දෙවියන් උදෙසා දීප ආරාධනය සිදු වෙද්දී දේවාලය වටා වන්දනාවේ නියලීමයි.

23. 'උලගප් පෙරුමංෂම්' යනුවෙන් විශේෂයෙන් හඳුන්වනු ලබන මංෂම් හි ආරුමුග ස්වාමි දෙවියන් වැඩ සිටින ශ්‍රී ලාංකේය දේවාලය වන්නේ,
   (1) නල්ලූර් කන්දස්වාමි දේවාලය ය.
   (2) ඉනුවිල් කන්දස්වාමි දේවාලය ය.
   (3) මණ්ඩූර් මුරුගන් දේවාලය ය.
   (4) කතරගම දේවාලය ය.

24. ගායනා කරන ඕනෑම කෙනෙකුගේ හිත සැනසෙන හැකියාව සහිතව මානික්කවාසකර් විසින් ගායනා කරන ලද ගීතිකාව කුමක් ද?
   (1) "මන්දිරමාවදු නීරු වානවර් මේලදු නීරු...."
   (2) "උට්ටෘමෙම සේර්වදු මෙයියිනෙයේ...."
   (3) "මීලා අඩිමෙම උමක්කේ ආලායිප්...."
   (4) "පාල්නිනෛන් දූට්ටුම් තායිනුම් සාලප්...."

25. ඈත අතීතයේ දකුණු භාරතයේ දීපාවලි උත්සවය සමරා ඇති බවට අදාළ සාක්ෂියක් වන්නේ,
   (1) රාජේන්ද්‍රන් සෙල්ලිපිය ය.
   (2) දෙවන රාජරාජන් සෙල්ලිපිය ය.
   (3) තිරුබුවන මල්ලන්ගේ කන්නඩ සෙල්ලිපිය ය.
   (4) රාජසිම්මන් සෙල්ලිපිය ය.

26. "සත්‍යම් වද, ධර්මම් සර" යනුවෙන් සත්‍යයේ විශේෂත්වය පෙන්නුම් කරන ග්‍රන්ථය,
   (1) උපනිෂද් ය. (2) ආගමම් ය. (3) පුරාණම් ය. (4) වේදය ය.

27. කොල්ලිමලවන් රජතුමාගේ දරුවාට වැලඳුණු මුයලගන් රෝගය සුව කිරීම සඳහා තිරුඥානසම්බන්තර් ගැයූ ගීතිකාව කුමක් ද?
   (1) "ඉඩරිනුම් තලරිනුම්...."
   (2) "අව්විනෛක්කිව්විනෛ...."
   (3) "තුනිවලර් තිංගල්...."
   (4) "මට්ටිට්ට පුන්නෛ...."

28. දෙවියන් උදෙසා දේවාල උද්‍යාන නිර්මාණය කරමින් සේවය ලබා දී විමුක්තිය ලබාගත් අය ඇතුළත් වරණය කුමක් ද?
   (1) තිලගවතියාර් සහ මුරුගනායනාර්
   (2) සිවගාමියාණ්ඩාර් සහ තිරුඥානසම්බන්තර්
   (3) තිලගවතියාර් සහ කණ්ණප්පනායනාර්
   (4) මුරුගනායනාර් සහ තිරුනාලෛපෝවාර්

29. මායාදුන්නේ රජතුමාගේ සීතාවක රාජධානියේ නිර්මාණය කරන ලදැයි සැලකෙන ශිව දේවාලය කුමක් ද?
   (1) වෙරණ්ඩි දේවාලය
   (2) නගරීසන් දේවාලය
   (3) මුනීශ්වරම්
   (4) දෙවිනුවර දේවාලය

30. "එණ්ණෙන් කුණමුරෙක්කු ඉසෛන්ද වණ්ණමේ...." යන්නෙහි සඳහන් කරනු ලබන්නේ දෙවියන්ගේ කුමන ගතිලක්ෂණය ද?
   (1) තුන්වාර්ගික ශරීරය (තිරුමේනි)
   (2) ගුණාංග අටක්
   (3) දේව ක්‍රියා පහක් (ඓන්තොලිල්)
   (4) ලක්ෂණ දෙකක්

31. පංචාංගයේ කොටස් පහට ඇතුළත් **නොවන්නේ**,
   (1) වාරම් ය. (2) කරණම් ය. (3) ඥානය ය. (4) තිදි ය.

32. ප්‍රාරප්ද විනෛ තුනම ඇතුළත් කාණ්ඩය කුමක් ද?
   (1) ආණවම්, කන්මම් සහ මායෛ
   (2) ඉච්චෛ, පරේච්චෛ සහ අනිච්චෛ
   (3) කාලම්, නියති සහ කලෛ
   (4) සදාක්කියම්, ඊසුරම් සහ සුත්තවිත්තෛ

33. බෞද්ධ ධර්මයේ පෞරාණිකර් යන අය,
   (1) ගෞතම බුදුන් විෂ්ණු දෙවියන්ගේ අවතාරයක් ලෙස සලකයි.
   (2) ගෞතම බුදුන්ට පමණක් වන්දනා කරයි.
   (3) අවලෝගිදීෂ්වරර්ට වන්දනා කරයි.
   (4) ගෞතම බුදුන් දෙවියෙකු ලෙස පිළිනොගනියි.

[හතරවැනි පිටුව බලන්න.

WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**34.** ලේ දන් දීම සහ ශරීරයේ කොටස් දන් දීම වැනි උසස් ක්‍රියාවල යෙදුණු හින්දු රජවරු සඳහා උදාහරණ වන්නේ,
(1) අරිච්චන්ද්‍රන් සහ දුෂ්යන්තන් ය. (2) අරිච්චන්ද්‍රන් සහ කුමනන් ය.
(3) දුෂ්යන්තන් සහ සිබිචක්‍රවර්ති ය. (4) කුමනන් සහ සිබිචක්‍රවර්ති ය.

**35.** මානික්කවාසහර්තුමාගේ සමාජ සේවා අතුරෙන් එකක් වන්නේ,
(1) පාණ්ඩ්‍ය රජතුමාගේ උදරාබාධය (වෙප්පුනෝයි) සුව කිරීමයි.
(2) තිල්ලෙහි බෞද්ධ රජ කෙනෙකුගේ දියණියට කථා කිරීමේ හැකියාව ලබා දීමයි.
(3) වියළි කාන්තාර ප්‍රදේශය මුහුද හා සම්බන්ධ සශ්‍රික ප්‍රදේශයක් කිරීමයි.
(4) සමන ආගමිකයෙකු වූ පල්ලව රජතුමා ශෛව භක්තිකයකු බවට පත් කිරීමයි.

**36.** මංගල චාරිත්‍රවල දී එළදෙන දර්ශනය කිරීමේ (කෝ දරිසනම්) අරමුණ වන්නේ,
(1) නව ජීවිතයක් ආරම්භ කිරීමේ දී එහි සුබදායී බව හා පාරිශුද්ධත්වය සංකේතවත් කිරීමයි.
(2) ජීවිතයේ වටහාගැනීම් හා අන් අයට අවස්ථා ලබා දීම් පිළිබඳව උපදෙස් දීමයි.
(3) වයස්ගත කාලයේ ද එකට සිටින බව සංකේතවත් කිරීමයි.
(4) මනසින් සහ සිරුරෙන් දෙදෙනාම එක් අයෙකි යන දර්ශනය අවධාරණය කිරීමයි.

**37.** ස්වාමි විපුලානන්දර් පුවත්පත් කතෘවරයකු ලෙස සේවය කරමින් එළිදැක්වූ 'ප්‍රකාශන' ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) ශෛව උදයබානු, ඉලංගෙ නේසන් සහ ප්‍රබුද්ධභාරත
(2) විඥ්ඥානතීබම්, විවේගානන්දතීබම් සහ යාල්නූල්
(3) විඥ්ඥානවර්තිනි, වේදාන්තපරිභාශෛ සහ රාමක්‍රිෂ්ණතීබම්
(4) වේදාන්තකේෂරි, රාමක්‍රිෂ්ණවිජයම් සහ ප්‍රබුද්ධභාරත

- පහත සඳහන් වගුවේ A සිට I දක්වා දී ඇති තොරතුරු ආශ්‍රයෙන් අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ශෛව ආගම වර්ධනය කළ ආගමික කුරවර්ලා | ජීවිත සිද්ධිය | ග්‍රන්ථ |
|---|---|---|
| A – මෙයිකණ්ඩ දේවර් | D – වසා තිබුණු තිරුමරෛකොට්ටු දේවාලය විවෘත කිරීමට ගායනා කිරීම | G – තිරුක්කෝවෙයාර් |
| B – මානික්කවාසහර් | E – තිරුවෙණ්ණෛ නල්ලූර්හි විමුක්තිය ලබා ගැනීම | H – තිරුත්තාණ්ඩහම් |
| C – තිරුනාවුක්කරසර් | F – පාණ්ඩ්‍ය රජු ලබා දුන් රන්කාසි ශිව භක්තිකයන්ගේ බඩගින්න තුරන්කිරීමට භාවිත කිරීම | I – ශිවඥානපෝදම් |

**38.** ශෛව සිද්ධාන්තය පිළිබඳ තුන්ද්‍රව්‍ය (මුප්පොරුල්) සත්‍යතාව මුල්වරට ස්ථිර කළ අය හා සම්බන්ධ කාණ්ඩය
(1) ADH ය. (2) AEI ය. (3) BDH ය. (4) BEI ය.

**39.** "එන් කඩන් පණි සෙයිදු කිඩප්පදේ" (මගේ යුතුකම සේවය කිරීමයි.) යනුවෙන් සඳහන් කළ අය හා සම්බන්ධ කාණ්ඩය
(1) ADI ය. (2) AEH ය. (3) CDH ය. (4) CEG ය.

**40.** තිරුවාසගම් ගීතිකාව ගායනා කළ අය හා සම්බන්ධ කාණ්ඩය
(1) BDG ය. (2) BFG ය. (3) CEI ය. (4) CFG ය.

* *

[පස්වැනි පිටුව බලන්න.

WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....